කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2017/2018

INR 2121 - සාම අධ්‍යයනය හැඳින්වීම

කාලය පැ දෙකයි (02)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න. පළමු කොටසින් එක් ප්‍රශ්නයක් (01) හා දෙවන කොටසින් ප්‍රශ්න දෙකක් (02) බැගින් තෝරාගන්න.

---

**01 කොටස:**

**එක්කෝ**

I. "සාමය" යන්නෙහි විවිධ නිර්වචනයන් සපයමින් උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

**නැතිනම්,**

II. "සාම අධ්‍යයන විෂය" සුවිශේෂී විෂයක් ලෙස විකාශනය වීම විග්‍රහ කරන්න.

---

**02 කොටස**

1. ප්‍රශ්න කොටස් දෙකටම පිළිතුරු සපයන්න
   - I. යොහැන් ගැල්තුන්ගේ (Johan Galtung) "ප්‍රචණ්ඩතා ත්‍රිකෝණය" (Violence Triangle) යනු කුමක්ද?
   - II. ගැටුම් අවස්ථාවන්හීදී ව්‍යුහාත්මක හා සංස්කෘතික ප්‍රචණ්ඩත්වය (Structural and Cultural Violence) දක්නට ලැබෙන ආකාරය උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න.

2. ප්‍රශ්න කොටස් දෙකටම පිළිතුරු සපයන්න
   - I. "උපායික සාමය-ගොඩනැඟීම" (Strategic Peacebuilding) යනු කුමක්ද?
   - II. "පශ්චාත් යුධ අභියෝග වලට මුහුණ දීමේදී සාමයෙහි උපායමාර්ගයන් (Peace Strategies) වැදගත් වේ" ඉහත ප්‍රකාශය උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න.

3. ප්‍රශ්න කොටස් දෙකටම පිළිතුරු සපයන්න
   - I. "අවිහිංසා සාම ප්‍රවේශය" (non-violence peace approach) හා සබැඳි මහත්මා ගාන්ධිගේ ප්‍රතිපත්තීන් විස්තර කරන්න.
   - II. "ආගම ගැටුම් ඇතිකරවන්නක් සේම සාමය ඇතිකරවන්නක්ද වේ" උදාහරණ සපයමින් සවිස්තරාත්මක රචනාවක් ලියන්න.

4. "තිරසාර සාම ප්‍රයත්නයන් (Sustainable Peace) මඟින් සාමය බහුවිධ ප්‍රතිමානයන්ගෙන් (multiple dimensions) ස්ථාපනය වේ" උදාහරණ සපයමින් ඉහත කියමන විග්‍රහ කරන්න.

5. පහත මාතෘකා අතරින් <u>තුනක් (03)</u> පමණක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   - I. රෝලන්ඩ් පැරිස් හඳුන්වා දුන් ලිබරල් සාමය (Liberal Peace by Roland Paris)
   - II. සාම ව්‍යාපාරවල (Peace Movements) විකාශනය
   - III. "ඉහළ සිට පහළට" (Top-Down) හා "පහළ සිට ඉහළට" (Bottom-Up) සාමය ගොඩනැඟීම
   - IV. ආගමික ත්‍රස්තවාදය (Non-Secular Terrorism)
   - V. ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සාමය-ගොඩනැඟීමේ ප්‍රයත්නයන්

***************